# සෞඛ්‍යය සඳහා වන ජනතා ප්‍රකාශය

## පූර්විකාව

සෞඛ්‍යය මානව අයිතියකි. එමෙන්ම සාමාජීයිය ආර්ථික සහ දේශපාලන තලයේ ප්‍රකාශනයකි.අසමානතාවය, දුප්පත්කම, සූරාකෑම, ප්‍රචණ්ඩත්වය සහ අසාධාරණය පීඩිත සහ සාමාන්‍ය ජනයාගේ අයහපත් සෞඛ්‍යයේ සහ මරණයේ මූලයන් වේ. සියලු දෙනාටම සෞඛ්‍යය යන්න බලසම්පන්න උනන්දුකරනයන් අභියෝගයට ලක් කරන අතර ගෝලීකරණයට එරෙහිවන්නකි. එමෙන්ම දේශපාලන හා ආර්ථික ප්‍රමුඛත්වයන් බැරෑරුම් ලෙස වෙනස් කරන්නකි.

මෙම ප්‍රකාශනය ගොඩනංවනු ලබන්නේ මීට පෙර ඉතාමත් අවම මට්ටමින් හඬ ඇසුනා වූ ජනයාගේ දර්ශනය මතය. එය ජනතාව ගේ විසඳුම් ගොඩනැංවීමට උනන්දු කරනු ලබන අතර ප්‍රාදේශීය අධිකාරීන්, මධ්‍යම රජය, ජාත්‍යන්තර සංවිධාන සහ සංස්ථා සමග වගකීම් දැරීමට උරදෙයි.

## දර්ශනය

යහපත් ලොවක් ගොඩනංවන අපගේ දෘෂ්ඨියේ හදවත බවට පත්වනු ලබන්නේ සමානාත්මතාවය මත පදනම් වන පරිසරාත්මක තිරසාර සංවර්ධනය සහ සාමය වේ. ලොව සියල්ලන් තුලින් සෞඛ්‍යයමත් ජීවිතයක් යනු , එයට ගෞරව කිරීම, ඇගයීම සහ මනාව සිහි කිරීමත්ය. ජනයාගේ හැකියාවන් පිඹිදවීමට ලොවට හැකියාව ලැබීම අන් අයගේ හැකියාවන් ශක්තිමත් කිරීම ලොව වසන ජනයාගේ හඬ මගින් අප ජීවිත තීරණාත්මකව හැඩගැස්වීම යථාර්ථව ගොඩ නැංවීමය.

## සෞඛ්‍යය අර්බුදය.

රෝග සහ මරණ අපව දිනපතා කෝපයට පත් කරනු ලබයි. මිනිසුන් රෝගයනට හෝ මරණවලට පාත්‍රවීමෙන් පමණක්ම අප කෝපයට පත්වනු ලබන්නේ නැත. බොහෝ රෝග සහ මරණවල මූල හේතූන් වන්නේ අප මත බලහත්කාරයෙන් පටවන ආර්ථික සහ සමාජයීය ප්‍රතිපත්තින් මගින් පැන නගින ඒවාය.

(මධ්‍යම ඇමෙරිකානු හඬක්)

මෑත යුගයන්හි ඇතිකලා වූ ආර්ථික වෙනස්කම් ජනයාගේ සෞඛ්‍යය කෙරෙහි බලපාන ලද අතර ඊට අමතරව ඔවුන්ගේ සෞඛ්‍යය සත්කාරයටත් අනිකුත් සමාජ සේවාවන් වලටත් බලපානු ලැබිය.

ලොව අවශ්‍යතම ප්‍රමාණයටත් වඩා ධනය පැවතුනත් දුප්පත්කම මෙන්ම කුසගින්න වර්ධනය වේ. දුප්පත් සහ පොහොසත් ජාතීන් අතර පවතින පරතරය තව තවත් වර්ධනය වෙයි. එමෙන්ම රටවල් තුල සමාජ පන්තීන් අතර, ස්ත්‍රී පුරුෂයන් අතර තැණයන් සහ මහල්ලන් අතර පවතින පරතරය වැඩිවෙමින් පවතී.

ලොව ජීවත්වනු ලබන බොහෝ ජන කොටස්වලට අවශ්‍යතම ප්‍රමාණවත් ආහාර, අධ්‍යාපනය, ආරක්ෂිත පානීය ජලය, වැසිකිලි පහසුකම්, නිවාස, භූමිය, අවශ්‍ය සම්පත්, රැකියා සහ සෞඛ්‍යය සත්කාර නොලැබේ. පීඩාවන් නොනවත්වා ඉටු වේ. මෙම සිද්ධීන් රෝග පැතිරීමටත් අප්‍රමාණවත් සෞඛ්‍යය සත්කාරයන් ප්‍රවලිත වීමටත් බලපානු ඇත.

විශ්වයේ ස්වභාවික සම්පත් අවදානම් තත්ත්වයකට පත්ව තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාරිසරික පිරිහීම සෑම කෙනෙකුගේම සෞඛ්‍යය කෙරෙහි බලපානු ඇත. විශේෂයෙන්ම දුප්පත් ජනයාගේ සෞඛ්‍යය තත්ත්වයට මෙය ඉතාමත් අහිතකර ලෙස බලපානු ලැබේ. මේ අතර ගැටුම් සඳහා නිර්මාණය වන්නා වූ ආයුධවල මහා පරිමාණ පැතිරීම මහත් අවදානම් තත්ත්වයක් උදාකර තිබේ.

පෞද්ගලික ලාභය පිළිබඳව උත්සුක වන්නාවූ සුලු දෙනෙකු අත ලොව පවතින සම්පත්වල මහා පරිමාන රැඳීම වඩිවෙමින් පවතියි. නව ලිබරල්වාදී දේශපාලනික සහ ආර්ථික ප්‍රතිපත්තීන් මගින් සුලු කණ්ඩායම් සතු බලසම්පන්න රාජ්‍යයන් ගොඩනැගීම ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක වෙළඳ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන මගින් සිදු කරනු ලබයි. උතුරේ සහ දකුණේ ජනයාගේ සෞඛ්‍යය සුභ සාධනයට මෙන්ම ජීවිතවලට එම ප්‍රතිපත්තීන් මෙන්ම ජාත්‍යන්තර සංස්ථාවල අසංවිධානාත්මක අහිතකර ක්‍රියාකාරකම් දැඩි ලෙස බලපානු ලබයි.

රජයේ අය වැය කප්පාදුව හේතු කොට ගෙන ජනයාගේ අවශ්‍යතා සම්පූර්ණ නොකරන අතර තව තවත් පිරිහෙන තත්ත්වයක් උදාකරනු ලැබේ. සෞඛ්‍යය සේවාවන් ලබා ගැනීම දුෂ්කර කර ඇති අතර අනුචිත අවම සැපයීමක් උදා කර ඇත.

<u>ජනතා සෞඛ්‍යය ප්‍රකාශනයේ මූලධර්ම:</u>

- පුද්ගලයකුගේ වර්ධනය, වාර්ගික භාවය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, වයස, හැකියා, ලිංගික ස්වභාවය හෝ පංතිය නොසලකා උසස්මතම සෞඛ්‍යය සහ සුභ සාධනයක් ලැබීම පුද්ගලයකුගේ මානව අයිතියක් වෙයි.

- 1978 අල්මා ආටා ප්‍රකාශනයෙන් එළිදැක්වූ පරිදි ජාත්‍යන්තර සවිස්තරාත්මක ප්‍රාථමික සෞඛ්‍යය සංරක්ෂණ මූලධර්ම සෞඛ්‍යය සඳහා ප්‍රතිපත්ති සම්පාදනයේ දී පදනම් කොට ගත යුතුය. කෙදිනවත් වඩා අද සෞඛ්‍යය සහ සෞඛ්‍යය සත්කාරය සඳහා සමානාත්මතාවය, සහභාගිත්වය සහ බහු පාර්ශවීය ප්‍රවේශය අවශ්‍යය.

- ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක සෞඛ්‍යය සේවාවක් සැපයීමේත්, ජනයාගේ මිලට ගැනීමේ හැකියාව අනුව නොව අධ්‍යාපනය සහ සෞඛ්‍යය සේවාවන් සැපයීමත් රජයේ මූලික වගකීමක් ලෙස සහතික කළයුතුය.

- සියලුම සෞඛ්‍යය සහ සමාජ ප්‍රතිපත්තීන් සහ වැඩ සටහන් සැකසීමේදීත්, ක්‍රියාත්මක කිරීමේදීත්, ඇගැයීමේදීත් ජනයාගේ සහභාගිත්වය සහ ජනතා සංවිධානවල සහභාගිත්වය අත්‍යාවශ්‍යය අංගයක් විය යුතුය.

- සෞඛ්‍යය, දේශපාලනික, ආර්ථික, සමාජීය සහ භෞතික පරිසරයේත්, තිරසාර සංවර්ධනයේත්, ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදනයේත් තීරණ ගැනීමේ දී මූලිකව සලකා බැලිය යුතු සාධකය විය යුතුය.

- ගෝලීය වශයෙන් සිදුවන සෞඛ්‍යය අර්බුදයේ දී අප විසින් පුද්ගලයන් ලෙස, ප්‍රජාවන් ලෙස ප්‍රාදේශීය වශයෙන්, ජාතික වශයෙන් සහ ගෝලීය වශයෙන්, යන සියලුම අංශයන්වල ඉල්ලුම් මත පදනම්ව මහා පරිමානව ක්‍රියාත්මක විය යුතුය.

<u>ක්‍රියාකාරිත්වයට ඇරයුම</u>

**සෞඛ්‍යය මානව අයිතියක් වශයෙන්:**
**සෞඛ්‍යය යන්න සමාජයක සමානාත්මතාවය සහ සාධාරණාත්මය පිළිඹිබු කරන්නකි. සෞඛ්‍යය සහ මානව අයිතීන් පිළිඹිබු කිරීම ආර්ථික හා දේශපාලන සිතුම් පැතුම් තුළින් මතුවන්නක් වේ.**

**මෙම ප්‍රකාශනය මගින් ලෝකවාසීන්ට ඇරයුම් කරනු ලබන්නේ:**

සෞඛ්‍යය පිළිබඳ අයිතිය ක්‍රියාත්මක කිරීමට සියලුම උත්සාහයන්ගෙන් උපකාර කළ යුතු බවය. සියලුම රජයන්ගෙන් ජාත්‍යන්තර සංවිධාන වලින් ඉල්ලා සිටින්නේ ප්‍රතිපත්තීන් සහ ක්‍රියාදාමයන් සෞඛ්‍යය සඳහා ඇති අයිතියට ගරු කොට නැවත ගොඩනංවා ක්‍රියාත්මක කරන ලෙසටය.

ජාතික ව්‍යවස්ථාවටත් නීති පද්ධතියටත් සෞඛ්‍යය සහ මානව අයිතීන් සම්බන්ධ කරන ලෙස ආණ්ඩුවලට බලපෑම් ඇති කිරීමට ජනතාව මත පදනම් වූ ව්‍යාපාරයන් ගොඩ නංවන ලෙසටය.

ලාභය තකා ජනයාගේ සෞඛ්‍යය අවශ්‍යතා සූරාකෑමට විරුද්ධව සටන් කරන ලෙසටය.

## <u>සෞඛ්‍යය සඳහා පුළුල් තලයක පූර්ව අවශ්‍යතා</u>

ආර්ථික අභියෝගිතා:

ආර්ථිකය ජනතා සෞඛ්‍යය සඳහා ප්‍රධානතම බලපෑමක් ඇති කරයි. ආර්ථික ප්‍රතිපත්තීන් මගින් සමානාත්මතාවය ප්‍රමුඛ කරයි. ජනතාවගේ සෞඛ්‍යය වර්ධනය සහ සුග සාධන ආර්ථිකය ජනතා සෞඛ්‍යය හා සමාජ සුභ සාධනය මගින් වැඩි දියුණු කරනු ලැබේ.

ජාතික ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවිධාන මගින් පවරන්නා වූ බොහෝ දේශපාලනික, මූල්‍යමය, කෘෂිකාර්මික සහ කාර්මික ප්‍රතිපත්තීන් මගින් ජනයා ඔවුන්ගේ ජීවිත සහ ජීවිතය ගෙන යන්නා වූ මාර්ග වලින් ඉවත් කරනු ලබන අතර මූලිකවම ධනපති අවශ්‍යතාවයනට ප්‍රතිචාර ගෙන දේ. ආර්ථික ගෝලියකරණය සහ ස්වාධීනකරණය මගින් අසමානතාවයන් ජාතීන් අතර මෙන්ම අභ්‍යන්තරවම උදා කරනු ලබයි.

බොහෝ රටවල් විශේෂයෙන්ම බොහෝ බලවතුන් තම සම්පත්, ආර්ථික සම්බාධක, යුද්ධමය මැදිහත්වීම් ඇතුලත්ව උපයෝගී කර ගනු ලබන්නේ ජනයාගේ ජීවිත විනාශ කරමින්ම තත්වයන් තහවුරු කර ගැනීමටය.

ලෝකවාසී ජනතාවට ජනතා සෞඛ්‍යය සැලැස්මට ආරාධනා කරනු ලබන්නේ ............

- විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජීය පරිසරය ජනතා ආර්ථිකය සහ සෞඛ්‍යය අයිතීන් විනාශ කරනු ලබන්නා වූ ලෝක වෙළඳාම් ව්‍යුහය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කිරීමටය.

- මෙම ප්‍රතිසංස්කරණ මගින් ජාත්‍යන්තර බුද්ධිමය අයිතිය සඳහා පනවා ඇති නීතින් මෙන්ම වෙළඳාම මූලික කොට පනවා ඇති ලෝක වෙළඳ සංවිධානයේ ව්‍යුහය ජනතා සෞඛ්‍යය ආරක්ෂා කිරීමට බැඳී සිටිය යුතුය.

- තෙවන ලොව මෙය අහෝසි කිරීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව තුල දියුණු වෙමින් පවතින රටවල අයිතීන් සහ අවකාශ ප්‍රවර්ධනය වන පරිදි මූලික වෙනසක් ඇති කරන ලෙස ඉල්ලුම් කළ යුතුය.

සෞඛ්‍යය දේශපාලනික ආර්ථිකමය වන අතර මානව අයිතියක් වේ. අසමානතාවය දුප්පත්කම සූරාකෑම ප්‍රචණ්ඩත්වය සහ අසාධාරණත්වය දුප්පත් සහ සාමාන්‍ය ජනයාගේ අයහපත් සෞඛ්‍යයේ මෙන්ම මරණවලද මූල හේතූන් වේ. සියලු දෙනාටම සෞඛ්‍යය යන්නේ අරුත බලසම්පන්න උනන්දුවීම් අභියෝගයට ලක් කරයි. එය දේශපාලනික ආර්ථික ප්‍රමුඛතාවන් බලවත් ලෙස වෙනස් කරනු ලබන අතර ගෝලීකරණයට එරෙහිවන්නක් ද වේ.

මෙම ප්‍රකාශනය ගොඩ නැංවූයේ මෙයට පෙර හඬක් ගොඩනැංවීමට නොහැකි වූ ජනයා සතුව පවතින දර්ශනයෙන් ය. එය තමන්ගේ විසඳුම් ඉදිරිපත් කිරීමට ධෛර්යමත් කරනු ලැබූ අතර, ගණනය කිරීම ප්‍රාදේශීය අධිකාරීන්, ජාතික ආණ්ඩු, ජාත්‍යන්තර සංවිධාන සහ සංස්ථා සතු වේ.

ජනතා සෞඛ්‍යය සඳහා අහිතකරව බලපාන්නා වූ අන්තර් ජාතික සමාගම්වල බලපෑම වලකාලීමට ඔවුන්ගේ එනම් සේවකයන් සූරාකෑම, පරිසරය අයහපත් තත්ත්වයකට ඇද දැමීම, ජාතික ස්වාධීනත්වය බිඳ හෙලීම වලකාලීමට නීතිමය සහතිකයන් සඳහා ඉල්ලුම් කළ යුතුය.

ආණ්ඩු විසින් කෘෂි කාර්මික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කරන කල්හි ජනතා අවශ්‍යතා මත මිස වෙළඳපොළ ඉල්ලුම මත පදනම් නොවිය යුතුය යන්න සහතික විය යුතුය. ඒ මගින් ආහාර සුරක්ෂිතභාවය මතත්, සමානව ආහාර ලබා ගැනීමත් සහතික විය යුතුය.

බුද්ධිමය දේපොල නීතින් තුල මහජන සෞඛ්‍යය අයිතීන් ආරක්ෂා කිරීම උදෙසා ජාතික ආණ්ඩු ක්‍රියාත්මක විය යුතු යයි ඉල්ලුම් කළ යුතුය.

ජාත්‍යන්තර ප්‍රාග්ධනය උදෙසා පාලනයත් බදු පැනවීමත් සඳහා ඉල්ලුම් කළ යුතුය.

සෞඛ්‍යය සඳහා වන්නා වූ සියලුම ආර්ථික ප්‍රතිපත්තීන් තුල සමානාත්මතාවය, ප්‍රමතිගාවය සහ පාරිසරික බලපෑම් ඇගයීම් මෙන්ම ක්‍රියාත්මක වනු ලබන මානයන් පිළිබඳ සහතිකවීම් අවධාරණය කළ යුතුය.

වර්ධනය මූලික කොට ගත් ආර්ථික න්‍යායනට සහ නැවත ස්ථානගත කරනු ලබන මානව සහ තිර සාර සමාජ සඳහා අභියෝග කළ යුතුය. ආර්ථික න්‍යායන්, පාරිසරකි බාධා, සමානාත්මතාවයේ හා සෞඛ්‍යයේ මූලික වැදගත්කම මිළ නොවන ශ්‍රමය, නොසලකා හරින ලද කාන්තා සේවය විශේෂිතව සැලකිල්ලට ගත යුතුය.

<u>සමාජ සහ දේශපාලන අභියෝග</u>

සවිස්තරාත්මක සමාජ ප්‍රතිපත්තීන්වල මනුෂ්‍ය ජිවිත සහ ජීවිත උදෙසා හිතකර බලපෑමක් පවතී ආර්ථික ගෝලීයකරණය සහ පෞද්ගලිකරණය මගින් ප්‍රජාවන් පවුල් ඒකක සහ සංස්කෘතින් බිඳ හෙලනු ලබයි. සමාජයන් හි තිරසාර පැවැත්ම සුරැකීමට කාන්තාවන් අත්‍යාවශ්‍යය. නමුත් ඔවුන්ගේ මූලික අයිතීන් ගණන් නොගන්නා හෝ පිළිනොගන්නා තත්ත්වයක පවතී. ඔවුන්ගේ අයිතීන් මෙන්ම පුද්ගලිකත්වය ද කඩ කරනු ලබයි.

මහජන ආයතන බිඳ දමා සහ දුර්වල කොට තිබේ. මහජන ආයතනවල බොහෝ වගකීම් පෞද්ගලික ආයතනයනට පවරා තිබේ. විශේෂිතවම සංස්ථා හෝ ජාතික හා අන්තර් ජාතික ආයතනයන් ජනතාවගෙන් ඈත් කොට ඇත. තවදුරටත් දේශපාලන පක්ෂවල හා වෘත්තීය සමිතීන්ගේ බලය බොහෝ දුරට අඩු කොට ඇත. මේ අතර ප්‍රතිගාමී සහ මූලධර්මවාදීන්ගේ බලය වැඩිවෙමින් පවතී. දේශපාලන සංවිධානවල සහ ප්‍රජා ව්‍යුහයන් තුල සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කළ යුතුය. ඒවාහි විනිවිද භාවය සහ ගණනය සහතික කිරීම හදිසි අවශ්‍යතාවයක්ව පවතී.

මෙම ප්‍රකාශනය ලොව වසන ජනයාගෙන් ඉල්ලනු ලබන්නේ:

ජනයාගේ පූර්ණ සහභාගිත්වය ඇතුව සවිස්තරාත්මක ප්‍රතිපත්තීන් වර්ධනය කොට භාවිතා කිරීම සඳහා ආධාර කරන ලෙසට ඉල්ලුම් කරන ලෙසටත්ය.

සියලුම පුරුෂයන්ටත් සියලුම කාන්තාවනටත් රැකියාවක් කිරීමටත් ජීවිතය ගෙන යැමටත්, තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමත්, දේශපාලන සහභාගිත්වයටත් ආගමක් තෝරා ගැනීමටත්, ඇදහීමටත් අධ්‍යාපනය සහ ගැටුම්වලින් තොරවීමටත් යන අයිතීන් සහතික විය යුතුය.

නොසලකා හරින ලද කණ්ඩායම්වල කායික මානසික සහ අධ්‍යාත්මික සෞඛ්‍යය සහ මානව අයිතීන් ආරක්ෂා කිරීමටත් වර්ධනය කිරීමත් අවශ්‍යතම නීතින් ගෙන ඒමට ආණ්ඩුවලට බලපෑම් කළ යුතුය.

දේශපාලන න්‍යාය පත්‍රයේ අධ්‍යාපනයට හා සෞඛ්‍යයට ප්‍රථම ස්ථානය ලබා දීමට ඉල්ලුම් කළ යුතුය. ළමුන් සහ වැඩිහිටියන් සඳහා ගුණාත්මක අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු අතර විශේෂයෙන්ම ගැහැණු ළමුන් සහ කාන්තාවන් උදෙසා පූර්ව ළමා විය අධ්‍යාපනය සහ සත්කාරය ඇතුලත් කළ යුතුය.

ළමා සුරැකුම් සේවාවන්, ආහාර බෙදාහැරීම නිවාස සැපයීම, පුද්ගලයන් හෝ ප්‍රජාව වෙත සෞඛ්‍යය සේවාවන් සැපයීමේ ක්‍රියාදාමයන් රජය මගින් කළ යුතුය යන්න ඉල්ලුම් කළ යුතුය.

යම්කිසි ප්‍රතිපත්තියක් මගින් රැකීරක්ෂා නැතිවේ නම් තමන්ගේ භූමියෙන්, නිවාස වලින් හෝ රැකියා මගින් අවතැන් කරනු ලබන්නේ නම් එම ප්‍රතිපත්තීන් හෙලා දැකීම සහ අවලංගු කිරීමට ඉල්ලුම් කළ යුතුය.

මූලධර්මවාදීන් විසින් බලහත්කාරයෙන් තර්ජනයට ලක් කරනු ලබන්නා වූ විශේෂයෙන් කාන්තාවන්ගේ, ළමුන්ගේ සහ සුලු කණ්ඩායම්වල අයිතීන් සහ පුද්ගලගත නිදහස විනාශ කිරීමට විරුද්ධත්වය පල කොට එය වලකාලිය යුතුය.

ලිංගික සංචාරක ව්‍යාපාරයට සහ ගෝලීමය කාන්තා සහ ළමා වෙළදාමට එරෙහි විය යුතුය.

## පාරිසරික අභියෝගතා:

ජල සහ වා දූෂණය සීඝ්‍රකාල ගුණ වෙනස්වීම්, ඕසෝන් තරලය විනාශවීම, න්‍යෂ්ටි ශක්තිය සහ විනාශ රසායනික ද්‍රව්‍ය සහ පලිබෝධ නාශක, ජෛව විවිධත්වය පහත හෙලීම, වන විනාශය සහ පස සේදීම මගින් ජනතා සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරනු ලබයි. එයට මූලහේතූන් වන්නේ තිරසාර නොවන ස්වභාවික සම්පත් විනාශයත්, දීර්ඝකාලීන පූර්ණ දෘෂ්ඨියකින් තොරවීමත් පුද්ගලගත සහ ලාභ උපරිමය කර ගැනීමේ චර්යාවන් පැතිරීමත්, පොහොසතුන් විසින් වැඩි පරිභෝජනයත්ය. මෙම විනාශයට එරෙහි විය යුතු අතරම ඵලදායී ලෙස වහාම ආපසු හැරවිය යුතුය.

මෙම ප්‍රකාශනය ලොව වසන ජනයාගෙන් ඉල්ලනු ලබන්නේ

ජනතා සෞඛ්‍යයට හා පරිසරයට අහිතකර ලෙස බලපාන්නා වූ නමුදු රජයේ ආයතන ජාතික ආයතන සහ අන්තර්ජාතික ආයතන මගින් සිදු කරන්නා වූ අනතුරු දායක උවදුරු උදාකරණ ක්‍රියාදාමයන් නතර කරන ලෙසය.

සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් ඇගැයීමකට ලක් කොට අහිතකර තාක්ෂණයන් සහ ප්‍රතිපත්තීන් මගින් පරිසරයට අනතුරු හගවන සියලු දෑ නවතා දැමීමට ඉල්ලුම් කරන ලෙසය.

ආණ්ඩු තමන්ගේ භූමි සීමාවන් තුළ හරිත නිවාස තුල වායුන් අවම කිරීමට කැප වන ලෙසටත් ජාත්‍යන්තර දේශගුණික වෙනස්වීම් සම්මුතීන් මත දැඩිව සිටින ලෙසටත් උචිත නොවන උවදුරු ගෙනෙන අනුචිත තාක්ෂණ භාවිතයන්ගෙන් ඈත් වන ලෙසටත් ඉල්ලුම් කළ යුතුය.

දුප්පත් රටවලට සහ සුළු ජන කණ්ඩායම් වෙත අනතුරුදායක කර්මාන්ත, ධූලක සහ විෂ කිරණ ගෙන යෑමට විරුද්ධ විය යුතු අතර අපවිත්‍ර ද්‍රව්‍ය අවම කිරීමට ධෛර්මත් කළ යුතුය.

උතුරේ සහ දකුණේ දැඩි පරිභෝජනය මෙන්ම තිරසාර නොවන ජීවන රටාව අවම කළ යුතුය. පොහොසත් කාර්මික රටවල් ඔවුන්ගේ පරිභෝජනය සහ පරිසර දූෂණය සියයට 90 කින් අඩු කළ යුතුය.

වැඩකරු මාධ්‍යය කොට ගත් සුපරීක්ෂණයකින් යුත් වැඩකරන තත්ත්වයේ සුරක්ෂිතභාවය සහතික කරන වෘත්තීමය සෞඛ්‍යය සුරක්ෂිත කරනු ලැබීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීමට ඉල්ලුම් කළ යුතුය.

ප්‍රජාව තුල මෙන්ම නිවාස තුළ වැඩ කරන ස්ථානයේත් අනතුරු වලකාලීමට ගත යුතු පියවර සඳහා ඉල්ලුම් කළ යුතුය.

බුද්ධිමය අයිතිය ප්‍රතික්ෂේප කළ යුතු අතර සාම්ප්‍රදායික ස්වදේශීය දැනුම සහ සම්පත් පැහැර ගැනීමට විරුද්ධ විය යුතුය.

ජනතාව මාධ්‍ය කොට ගත් ප්‍රජා පාදක දර්ශකයන් පරිසරය සහ සමාජ ප්‍රගතිය සඳහා වර්ධනය කළ යුතු අතර ජනතා සෞඛ්‍යය සඳහාත් පාරිසරික පිරිහීම වලකාලීමටත් නීති පනා කළ යුතු අනුගතවීම් වර්ධනය කළ යුතුය.

යුද්ධය ප්‍රචණ්ඩත්වය සහ ගැටීම්

යුද්ධය සහ ප්‍රචණ්ඩත්වය සහගැටීම් ප්‍රජාවන් ව්‍යසනයක් ඇති කරනු ලබන අතර මානව ගෞරවය විනාශ කරනු ලබයි. විශේෂයෙන්ම කාන්තාවන් ළමුන් අතර මෙන්ම සාමාජිකයන් තුළත් කායික මානසික සෞඛ්‍යය ගැටලුන් වඩාත් ගැඹුරින් ඇති කරනු ලැබේ. එමෙන්ම ජාත්‍යන්තර ආයුධ වෙළදාම විනාශකාරී ලෙස දූෂණයට ලක් කරනු ලබන අතර සමාජ දේශපාලන සහ ආර්ථික ස්ථිරභාවය සහ සවන් අංශයන් කෙරෙහි ඈත්තා වූ සම්පත් විනාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ලොව වෙසෙන ජනයාගෙන් ඉල්ලනු ලබන්නේ:

සාමය සහ ආයුධවලින් තොරවීම සඳහා පවත්වන ව්‍යාපාරවලට සහාය දැක් විය යුතුය යන්නය.

- සියලු මාර්ගවල බිම් බෝම්බ ඇතුලුව විශාල හානි සිදු කරන අවි ආයුධ සහ වෙනත් ආයුධ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම. නිෂ්පාදනය පරීක්ෂා කිරීම හා භාවිතය ආදියටත් ආක්‍රමණවලටත් එරෙහිව කරනු ලබන ව්‍යාපාරයන්ට අනුග්‍රහය දැක්වීම.

- යුක්තිය හා සාධාරණත්වය ගෙන එන ස්ථිරසාර පැවැත්ම විශේෂයෙන්ම සිවිල් කෝලාහල හා වාර්ගික විනාශ අවම කර ගැනීමට ගන්නා උත්සාහයන්ට අනුග්‍රහ දැක්වීම.

- ළමයින් හමුදා භටයින් ලෙස යොදා ගැනීමත්, කාන්තා හා ළමා අපවයෝජනය, ස්ත්‍රී දූෂණය හා ඝාතන හෙලා දැකීම.

- මානව වාදී සහන කටයුතු යුධ කටයුතුවලට යොදා ගැනීමට එරෙහිව විරෝධතා පෑම.

- ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරමින් කටයුතු කරන බවට වග බලා ගැනීම පිණිසම එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සම්පූර්ණයෙන්ම වෙනස් කරන ලෙස ඉල්ලා සිටීම.

- සිවිල් ජනයාගේ සෞඛ්‍යයට හානි සිදුවිය හැකි ආක්‍රමණ කටයුතු එක්සත් ජාතීන් විසින් හෝ තනි තනි රටවල් විසින් සම්බාධක වශයෙන් නොපැනවන ලෙස ඉල්ලා සිටීම.

- අවට ප්‍රජාවන් සහ නගර අවි ආයුධවලින් තොර සාමයෙන් පිරි පරිසර බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටීමට ගුණගරුකව ප්‍රජා මූලික ඉල්ලීම් ඉදිරිපත් කිරීම දිරි ගැන්වීම.

- විශේෂයෙන්ම පුරුෂයාගේ ආක්‍රමනශීලි සහ හිංසාකාරී චර්යාවන් වලක්වා ගැනීමට හා අඩු කර ගැනීමටත් සාමකාමී හා ජීවිත දියුණු කර ගැනීමට දියත් කරන ව්‍යාපාරයන්ට හා ගන්නා ලබන කාර්යයන්ට අනුග්‍රහය දැක්වීම.

<u>ජනතා කේන්ද්‍ර කොට ගත් සෞඛ්‍යය අංශය</u>

ප්‍රාථමික සෞඛ්‍යය සංරක්ෂණ පහසුකම් ලබා ගැනීමට මිනිසාට මුදල් ගෙවීමට පුළුවන්කම තිබුණද ඒ ගැන නොසලකා ලොව පුරා සිටින හැමදෙනාටම පුළුල් ප්‍රාථමික සෞඛ්‍යය පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලා සිටීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වේ.

සෞඛ්‍යය සේවාවන් ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුය. එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් සපයා ගනිමින් ඒ සඳහා වගකීම දැරිය යුතුය.

මෙම ප්‍රඥප්තිය ජගත් ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනුයේ

- සෞඛ්‍යය සත්කාරය පුද්ගලීකරණය කොට එය වෙළඳ භාණ්ඩයක් බවට පත් කරන ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තිවලට විරෝධය පෑම.

- සෞඛ්‍යය ගැටළු විසඳා ගැනීමට වඩා ඵලදායි ක්‍රමය ප්‍රාථමික සෞඛ්‍යය සංරක්ෂණ ක්‍රමය බවත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් මුදල් අය කිරීමකින් තොරව ලොව හැමදෙනාටම ලැබෙන බවට සහතික වනු වස් සෞඛ්‍යය සේවාවන් සංවිධානය කිරීම. ප්‍රවර්ධනය හා ඒ සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය කිරීමට රජයෙන් ඉල්ලා සිටිය යුතුය.

- ජාතික සෞඛ්‍යය සහ ඖෂධ ප්‍රතිපත්ති යොදා ගැනීම ඒවා ක්‍රියාත්මක කිරීම හා බලවත් කිරීමට රාජ්‍යයන්ට බලකිරීම.

- රාජ්‍ය සෞඛ්‍යය සේවාවන් පුද්ගලීකරණය කිරීමට විරෝධය දැක්වීමට හා ප්‍රත්‍යක්ෂ ආයතන වශයෙන් පවත්වා ගෙන යන වෛද්‍යආයතන සහ රාජ්‍ය නොවන වෛද්‍ය සේවාවන් ඇතුලුව පුද්ගලික වෛද්‍ය අංශය වඩාත් ඵලදායි වන පරිදි ක්‍රමවත් කිරීම.

- දුගී ජනයාට යහපතක් සිදුවන අන්දමින්ද තිරස් ප්‍රවේශයන් මගහරවන්නාවුත් අන්තර්පාර්ශවීය කාර්යයන් සහතික කරන්නාවූද ලෝක සෞඛ්‍යය සංවිධාන කටයුතුවලට ජනතාව සහභාගී කරවා ගන්නාවූද, සාමුහිකව ලබන ප්‍රයෝජනයන් තොර බව සහතික කරන්නාවූද නිර්ධන සෞඛ්‍යය අභියෝගයන් ජය ගැනීමට ලෝක සෞඛ්‍යය සංවිධානයට කටයුතු කිරීමට හැකි වන අයුරින් එය සහමුලින්ම වෙනස් කොට එය පරිවර්ථනය කරන ලෙස ඉල්ලා සිටීම.

- රෝගීන් හා පාරිභෝගික අයිතීන් ඇතුලුව සෑම මට්ටමකදීම සෞඛ්‍යය පිළිබඳ තීරණ ගැනීමේදී ජනතාවට ඇති බලය හා කළ හැකි පාලනය දිරිගැන්වෙන කාර්යයන් කිරීම ඒවා වර්ධනය කිරීම හා ඒවාට අනුග්‍රහය දැක්වීම.

- පාරම්පරික හා විකල්පිය රෝග සුව කිරීමේ ක්‍රම පිළිගෙන ඒවා ප්‍රවර්ධනය කොට ඒවාට අනුග්‍රහය දැක්වීමත් ප්‍රාථමික සෞඛ්‍යය සංරක්‍ෂණ ක්‍රමයේ ඒවා සමෝදානය කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම, ඒවා පිළිගැනීම හා එයට අනුග්‍රහය දැක්වීම.

- සෞඛ්‍යය පිරිස් ගැටළු තේරුම් ගැනීමට යොමුවන්නවුන් අත්දැකීම් මුල් කර ගන්නාවූත් ස්වකීය ප්‍රවණතාවන් තුළ පවත්නා ලොවටම බලපාන ගැටළු හේතුවෙන් ඇතිවන බලපෑම වටහා ගැනීමට පුළුවන් වන පරිදි ඉහත ප්‍රජාව සමග එකමුතුව වැඩ කිරීමට ආයතන වලදී ඔවුන් ගැන සැලකිලිමත් වන ආකල්ප ඇති කිරීමද ඔවුන්ට ගරු කරන පිරිස් බවට සෞඛ්‍යය පරිවර්ථනය කිරීමට හැකි වන අයුරින් ද සෞඛ්‍යය පුහුනු කටයුතු සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටීම.

- වෛද්‍ය හා සෞඛ්‍යය තාක්‍ෂණයන් (ඖෂධ ඇතුලුව) වසා ගෙන ඇති පටලයන් ඉවත් කරන ලෙසත් ප්‍රජාවගේ සෞඛ්‍යය අවශ්‍යතාවන්ට ඒවා නොවැදගත්කිරීමටත් ඉල්ලා සිටීම.

- ජාන පර්යේෂණ හා ඖෂධ හා ප්‍රජනන සෞඛ්‍යය කාර්යය හා සංවර්ධනය ඇතුලුව සෞඛ්‍යය පිළිබඳ පර්යේෂණයන් අවශ්‍යතා මුල් කර ගෙන ප්‍රජා සහභාගිත්වය ඇතිව සිදු කරන ලෙස ඉල්ලා සිටීම සහ ඒවා ජනතාවගේ සහ ජනතාවගේ සෞඛ්‍යය සැලකිල්ලට ගන්නා වූ පරිදි වන ආචාර මූලධර්මයන්ට එකගව කළ යුතුය.

- ප්‍රජනන හා ලිංගික සම්බන්ධතා පැවැත්වීම සම්බන්ධයෙන් ස්වයං තීරණ ගැනීමටත් ජනගහන හා පවුල් සැලසුම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කෙරෙන බලකිරීම් වලට විරෝධතා පෑමටත් ජනතාවගේ අයිතීන්ට අනුග්‍රහය  දැක්වීම, සරු බව පාලනය කිරීමේ ආරක්ෂිත හා ඵලදායි ක්‍රම පරාශයම මෙම අනුග්‍රහයට ඇ.තුලත් වේ.

<u>සෞඛ්‍යය සම්පන්න ජගත් ජනතාවක් බිහි කිරීම සඳහා ජනතා සහභාගිත්වය</u>:

වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී විනිවිද වූද වගකීමෙන් යුතු වූද තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා ප්‍රබල ජනතා සංවිධානයන් සහ ව්‍යාපාරයන් මූලික අවශ්‍යතාවයන් වේ. ජනතාවගේ සිවිල් දේශපාලන ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතීන් සහතික කිරීම අත්‍යාවශ්‍යය.සෞඛ්‍ය හා මිනිස් අයිතිවාසිකම් වඩාත් සාධාරණ වූ ප්‍රවේශයකි. ප්‍රවර්ධනය කිරීම රජයන්ගේ මූලික වගකීම වන අතර, ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම න්‍යාමනය පාලනය කිරීම ජනයතු කිරීමේ දී විවිධාකාර සිවිල් සංවිධාන හා ව්‍යාපාර සහ මාධ්‍යවේදීන් විසින් විවිධ කාර්යභාරයන් ඉටු කළ යුතුව ඇත. ජගත් ප්‍රජාවගෙන් මෙම ප්‍රඥප්තිය අපේක්‍ෂා කරනුයේ:

- විශ්ලේෂණය කොට ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පදනම ඇති කිරීම සඳහා ජනතා සංවිධාන ඇති කොට සවිමත් කිරීම.

- හැම මට්ටමකදීම මහජන සේවාවන් පිළිබඳව තීරණ ගැනීමේදී විවෘතව සම්බන්ධ කර ගැනීම, දිරි ගැන්වීම, හා එය ප්‍රවර්ධනය කිරීම, හා ඊට අනුග්‍රහය දැක්වීම.

- සෞඛ්‍යයට අදාල ප්‍රාදේශීය හා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සම්මේලන වලදී ජනතා සංවිධාන නියෝජනය කරන ලෙස ඉල්ලා සිටීම. ජනතා කේන්ද්‍රකොට ගත් සහයෝගය දැක්වීමේ ජාලයන් ලොව පුරාම පිහිටුවා එමගින් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැගීමේ ප්‍රාදේශීය මට්ටමින් ගන්නා උත්සාහයන්ට අනුග්‍රහය දැක්වීම.

## ජනතා සෞඛ්‍යය සභාව සහ ප්‍රඥප්තිය:

ජනතා සෞඛ්‍යය සභාව පිළිබඳව සංකල්පය දශකයකට වැඩි කාලයක් පුරා සාකච්ඡාවට භාජනය වෙමින් පැවතිණි. 1998 වසරේදී සංවිධාන රැසක් එක් වී ජනතා සෞඛ්‍යය සඳහා ක්‍රියාවලියක් දියත් කොට ජාත්‍යන්තර සභාව රැස්වීම සැලසුම් කරන ලදී, එම රැස්වීම 2000 වසර අවසානයේ දී බංගලාදේශයේ දී පවත්වන ලදී, ජනතා සෞඛ්‍යය සභාව පූර්ව සහ පශ්චාත් කටයුතු රටපුරාම ආරම්භ කරන ලදී, වැඩමුළු ජනතාවගේ සෞඛ්‍යයට අදාල කතන්දර එකතු කිරීම හා සෞඛ්‍යය සඳහා ජනතා ප්‍රඥප්තිය කෙටුම්පත් කිරීම මෙම කටයුතු වලට ඇතුලත් විය. ලොව පුරාම වෙසෙන ජනතාවගේ සහ සංවිධානවල අදහස් මුල් කර ගනිමින් මෙම ප්‍රඥප්තිය සකස් කෙරේ. මෙය අනුමත කොට මෙය මුලින්ම අත්සන් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2000 දෙසැම්බර් මාසයේදී බංගලාදේශයේ සවාර් හි පැවැත් වූ සභාවේ රැස්වීම් වාරයේ දිය.

සහමුලින්ම වෙනස් කිරීම සඳහා ඉටු කරනු කාර්යයන් පිළිබඳව අප දක්වන උනන්දුව හා සැලකිල්ලද වඩා සෞඛ්‍යය සම්පන්න ජගත් ප්‍රජාවක් බිහිකිරීම පිළිබඳව අපගේ දර්ශනය (දැක්ම) ඒ සඳහා අවශ්‍යතාව ප්‍රකාශ කරන්නකි. මෙම ප්‍රඥප්තිය ඒ සඳහා එකගත්වය දක්වන්නක්ද වේ. එසේම එය ජගත් සෞඛ්‍යය ගොඩනැගිය හැකි වුත් ඒ සඳහා වෙනත් ජාලයන් හා සමගි සන්ධානයක් පිහිටුවා ගත හැකි වන්නාවූද ආයුධයකි.

ජනතා සෞඛ්‍යය මණ්ඩලය
People`s Health Assembly
(PHA)